කාටීසීය තාප්පය බිඳවැටීම

මනස යනු ද්‍රව්‍යයෙන් මුළුමනින් ම වෙන්වූවක් නොවෙයි යන්නේ අදහස්කරන්නේ කුමක්දැයි පැහැදිලිව දතයුතු ය. ඉන් කියැවෙන්නේ මනස ද්‍රව්‍යයෙන් සෑදී ඇත යන්න නො වෙයි. මනස සියුම් හෝ නොසියුම් හෝ ද්‍රව්‍යයකින් නිර්මානය වී ඇතැයි ඉන් ගම්‍ය නො වෙයි. මනස ද්‍රව්‍යයෙන් මුළුමනින් ම වෙන්වූවක් නොවෙයි යන්නෙන් ඩෙකාටේ පඬිවරයා අදහස් කළ දෙයට වෙනස් දෙයක් කියැවෙයි. ඩෙකාටේ විද්වතාට අනුව මනස ද්‍රව්‍යයෙන් මුළුමනින් ම වෙන් වී තාප්පයක එක් පැත්තක ඇත. තාප්පයෙහි අනෙක් පැත්තෙහි ද්‍රව්‍යය වෙයි. තාප්පය යනු සංකේතාත්මක දෙයක් බව ද මෙහි දී සඳහන්කළ යුත්තේ එසේ නොකළහොත් වැරදි අර්ථකථනවලට තුඩුදිය හැකි බැවින් ය.

තාප්පයකින් වෙන්වීමක් වැනි දෙයක් මෙහි දී කියැවෙයි. තාප්පයක දෙපැත්තේ ඇති වස්තු දෙකක් අතර පැටලීමක් නැත. එක් වස්තුවක් විසින් අනෙක් වස්තුව ආකර්ෂණය නොකෙරෙන්නේ දැයි යමකුට ප්‍රශ්නකළ හැකිවන්නේ නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය අනුව ඕනෑම වස්තුවක් වෙනත් වස්තුවක් ආකර්ෂණයකරන බැවින් ය. තාප්පයක් තිබුණත් නැතත් නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයට අනුව වස්තු එකිනෙක ආකර්ෂණය කෙරෙයි. මෙහි දී තාප්පයකින් මෙන් මනස හා ද්‍රව්‍යය එකිනෙකින් වෙන් වී ඇතැයි සැලකෙන්නේ මනසෙන් තොරව, මනසේ කිසිම වූ ආකාරයක බලපෑමකින් තොරව ද්‍රව්‍යය හා එහි ගුණ පවතින බව උපකල්පනය කෙරෙන බැවින් ය.

මෙහි දී තවත් එක් කරුණක් පැහැදිලිකළ යුතු ය. මනස සෑදී ඇත්තේ ද්‍රව්‍යයෙන් ද යන ප්‍රශ්නය කාටීසීය තාප්පයට අදාළ නැත. මනස ද්‍රව්‍යයෙන් සෑදී ඇතැයි යමකු කියන්නේ යැයි සිතමු. එවැනි මනසකට වුව ද ද්‍රව්‍යයෙන් වෙන් වී කාටීසීය තාප්පයේ එක් පැත්තකට වී සිටීමට හැකි ය. කාටීසීය තාප්පය පිළිබඳ අදහසට අනුව මනස යනු කතෘකාරකයක් නොවෙයි. එය තාප්පයේ එක් පැත්තකට වී අකර්මණ්‍ය ව මැදිහත්වීමකින් තොරව අනෙක් පැත්තෙහි සිදුවන දෙය නිරීක්ෂණය කරයි.

එය වෙනත් ආකාරයකට කියමු. තාප්ප උපකල්පනයට අනුව වස්තුවක පාට ඒ වස්තුවට ලබා දෙන්නේ මනස නො වෙයි. මනස ඇතත් නැතත් වස්තුවේ පාට ඒ වස්තුවට ඇතැයි ඩෙකාටේ පඬිවරයාගේ තාප්පයෙන් කියැවෙයි. එමෙන් ම යම්කිසි සමුද්දේශ රාමුවක, වස්තුවක මැනෙන ගම්‍යතාව ඒ මැන්නත් නැතත් වස්තුවට හිමිවෙයි. ගම්‍යතාව මැනගැනීමේදී සිදුවන්නේ මැනීමට කලින් වස්තුවට ඇති ගම්‍යතාව කුමක් දැයි දැනගැනීම ය. බීකරයක ඇති ද්‍රවයක උෂ්ණත්වය මැනීමේ දී ද නිරීක්ෂකයා ද්‍රවයට උෂ්ණත්වයක් ලබා නො දෙයි. ඔහු කරන්නේ ද්‍රවයට ඇති යම් උෂ්ණත්වයක් මැනගැනීම පමණකි.

ඩෙකාටේ පඬිවරයා විසින් කරන ලද්දේ එවකටත් නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි අවිඥානික ව උපකල්පනය කෙරුණු කරුණක් සවිඥානික ව ප්‍රකාශකිරීම ය. නිරීක්ෂකයා නිරීක්ෂණයකරන්නේ වස්තුවක ඇති පැහැය, ස්කන්ධය, ප්‍රවේගය, වස්තුවට යම් ලක්ෂ්‍යයක සිට ඇති දුර, විද්‍යුත් ආරෝපණය ආදිය බව නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි, එනම් නිව්ටෝනීය යාන්ත්‍රිකය ඇසුරෙන් ගොඩනැගී ඇති භෞතික විද්‍යාවෙහි, කවදත් අවිඥානික ව උපකල්පනය කෙරුණු කරුණක් විය. ඩෙකාටේ විද්වතා මනස, එනම් නිරීක්ෂකයාගේ මනස හා නිරී\ක්ෂ්‍යය කෙරෙන්න පැහැදිලිව දෙපැත්තකට වෙන්කෙළේ ය.

එහෙත් ඒ එසේ නො වෙයි. මනස, එනම් නිරීක්ෂකයාගේ මනස යනු පැත්තක සිට වස්තුවල කොහොමටත් ඇති ගුණ මැනගන්නා, නිරීක්ෂණයකරන යමක් නො වෙයි. නිරීක්ෂකයා යම් යම් දේ නිරීක්ෂණයකිරීමේ දී වස්තුව (එහි ගුණ) වෙනස්කරන බව ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි කියැවෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ කෝපන්හේගන් විවරණයට අනුව වස්තුව නිරීක්ෂණයකිරීමට පෙර වස්තුව සතුව නොතිබූ අගයක් නිරීක්ෂණයෙන් පසු වස්තුවට ලැබෙයි. ඒ අතර තවත් දෙයක් සිදුවෙයි. වස්තුවෙහි යම් ගුණයකට එතෙක් නොතිබූ අගයක් මැනීමේ දී, එනම් නිරීක්ෂණයෙහි දී ලැබෙන අතර, ඒ ගුණයෙහි ප්‍රතිබද්ධය යැයි කියැවෙන ගුණයට එතෙක් තිබූ අගය නැති වී යයි.

© Prof. Nalin De Silva

උදාහරණයක් ලෙස ගතහොත් නිරීක්ෂකයා ක්වොන්ටම් අංශුවක පිහිටීම දන්නේ යැයි සිතමු. පිහිටීම දන්නේය යන්නෙහි තේරුම නම් නිරීක්ෂකයාට සාපේක්ෂව අංශුවෙහි පිහිටීමට එක් අගයක් පමණක් ඇති බව ය. අංශුව යම් රාමුවක නිශ්චිත තැනක පිහිටයි. එයට වෙනත් තැනක සිට ඇත්තේ නිශ්චිත දුරකි. නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි ද අංශුවක පිහිටීම දන්නේ යැයි කී විට ඉන් අදහස්වන්නේ ඒ බව ය. ඒ අතර නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි අංශුවෙහි ගම්‍යතාවට ද නිශ්චිත අගයක් වෙයි. නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි දී අංශුවෙහි පිහිටීමට මෙන් ම ගම්‍යතාවට ද නිශ්චිත අගය වෙයි. මැන්නත් නොමැන්නත් අංශුවට ඒ අගය වෙයි. මැනීමේ දී කෙරෙන්නේ ඒ අගය කවරේදැයි නිරීක්ෂකයා විසින් දැනගනු ලැබීම පමණකි.

එහෙත් ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දී ඒ එසේ නො සිදුවෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාව පිළිබඳ ව කෝපන්හේගන් විවරණයට අනුව නිරීක්ෂකයකුට අංශුවක පිහිටීම හා ගම්‍යතාව එක්වර, සමගාමී ව, මැනගත නො හැකි ය. නිරීක්ෂකයා මැනීමෙහි දී කරන්නේ අංශුවෙහි එක්කෝ පිහිටීම නැත්නම් ගම්‍යතාව මැනගැනීම ය. පිහිටීම හා ගම්‍යතාව ප්‍රතිබද්ධ ගුණ වෙයි. එලෙස අංශුවෙහි වෙනත් ප්‍රතිබද්ධ ගුණ ද වෙයි. නිරීක්ෂකයාට එක් අවස්ථාවක කළහැක්කේ ප්‍රතිබද්ධ ගුණ දෙකකින් එකක් පමණක් මැනගැනීම ය. ඔහුට එක්වර ප්‍රතිබද්ධ ගුණ දෙකම මැනගත හැකි නො වෙයි.

එපමණක් නො වෙයි. කෝපන්හේගන් විවරණයට අනුව අංශුවට ඇත්තේ එක් ප්‍රතිබද්ධ ගුණයක නිශ්චිත අගයකි. අංශුවෙහි පිහිටීම දන්නේ යැයි කියමු. ඉන් කියැවෙන්නේ අංශුවෙහි පිහිටීම සඳහා නිශ්චිත අගයක් මැනගෙන ඇති බව ය. දැන් නැවතත් අංශුවෙහි පිහිටීම මැන්නොත් නිරීක්ෂකයාට ඒ සඳහා කලින් ලැබුණු අගය ම ලැබෙයි. එහි එතරම් ගැටළුවක් නැත. එහෙත් ප්‍රශ්නය වනුයේ නිරීක්ෂකයා දැන් අංශුවෙහි ගම්‍යතාව නිරීක්ෂණය කළහොත් ය. එලෙස නිරීක්ෂණයකිරීමේ දී ලැබෙන්නේ කිනම් අගයක් දැයි ඔහුට කිවහැකි නො වෙයි. අංශුවෙහි පිහිටීම මැනගෙන ඇති බැවින් එහි ගම්‍යතාව නොදනි යි. නොදනියි යන්නෙහි තේරුම අංශුවට ගම්‍යතාවක් ඇති නමුත් නිරීක්ෂකයා ඒ අගය නොදන්නා බව නො වෙයි. අංශුවට කෙසේවත් ගම්‍යතාවක් නැත.

නිරීක්ෂකයා අංශුවෙහි පිහිටීම දැනගෙන අංශුවෙහි ගම්‍යතාව මැනගත්විට අංශුවට ගම්‍යතාවක් ලැබෙයි. එනම් අංශුවෙහි ගම්‍යතාවට දැන් නිශ්චිත අගයක් වෙයි. එහෙත් නිරීක්ෂකයා ඒ ගම්‍යතා අගය දැනගන්නේ මැනගැනීමෙන් පසුව ය. මැනගැනීමට පෙර අංශුවට ගම්‍යතාවක් නැතිවා පමණක් නොව ගම්‍යතාව මැන්නොත් ලැබෙන්නේ කිනම් අගයක් දැයි නිශ්චිත ව කිවහැකි ද නො වෙයි. එයට හේතුව අංශුව ද ඒ බව “නො දැනීම” ය. අංශුවෙහි ගම්‍යතාව මැන්නොත් ඒ සඳහා කිනම් අගයක් ලැබේ දැයි “කීමට” අංශුවටවත් නො හැකි ය.

නිරීක්ෂකයාට කිවහැක්කේ අංශුවෙහි ගම්‍යතාව මැන්නොත් ඒ ඒ අගය ලැබීමට ඒ ඒ සම්භාවිතාව ඇති බව ය. එක් එක් අගය ලැබීමේ සම්භාවිතාව වෙනස්වෙයි. ගම්‍යතාවට ඇතැම් අගයක් ලැබීමට වැඩි සම්භාවිතාවක් වෙයි. එහෙත් ඒ අගය නොලැබී වෙනත් අගයක් ලැබීමට ද හැකි බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. කෙසේ වෙතත් අංශුවෙහි ගම්‍යතාව මැනීමෙන් පසු අංශුවට ගම්‍යතාවක් වෙයි. එහෙත් දැන් එයට නිශ්චිත පිහිටීමක් නැත. අංශුවෙහි පිහිටීම හා ගම්‍යතාව එක්වර මැනගැනීමට නොහැකිවීම එයට හේතුව වෙයි.

අංශුවට පිහිටීමක් නැත යන්නෙන් කියැවෙන්නේ නිරීක්ෂකයා අංශුවෙහි පිහිටීම පිළිබඳ කිසිත් නොදන්නා බව ය. එසේ ම අංශුව ද තම පිහිටීම ගැන නො දනියි. අංශුවට දැන් ඇත්තේ පිහිටීම හා ගම්‍යතාව යන ප්‍රතිබද්ධ ගුණවලින් ගම්‍යතාව පමණකි. නිරීක්ෂකයාට අංශුවෙහි පිහිටීම දැනගැනීමට අවශ්‍ය නම් ඔහු ඒ මැනගත යුතු ය. එවිට අංශුව අවකාශයේ යම් නිශ්චිත පිහිටීමක් ලබනු ඇත. මෙහි දී ද කලින් මෙන් ම අංශුව ගන්නා පිහිටීම කවරක් දැයි ඒ මැනීමට (නිරීක්ෂණයකිරීමට) පෙර නිරීක්ෂකයාට කිවහැකි නො වෙයි. ඔහුට කිවහැක්කේ ඒ ඒ පිහිටීම ලැබීමට ඒ ඒ සම්භාවිතාව ඇති බව ය.

එසේ නම් මේ සියල්ලෙන් කිවහැක්කේ අංශුව ඒ ඒ ගුණ ලැබීමේ දී නිරීක්ෂකයා ද හවුල්වන බව ය. වෙනත් වචනවලින් කිවහොත් අංශුවට ඒ ඒ ගුණ ලබාදෙන්නේ නිරීක්ෂකයා ය. නිරීක්ෂකයා මැදිහත්වීමෙන් අංශුවට යම් යම් ගුණ ලැබෙයි. නිරීක්ෂකයාගෙන් වෙන්වූ අංශුවක් හෝ නිරීක්ෂ්‍යයක් හෝ නැත. නිරීක්ෂකයා හා නිරීක්ෂ්‍යය එකට බැඳී ඇත. එනම්

© Prof. Nalin De Silva

මනස වස්තුවෙන් වෙන් වී නැත. වස්තුව හෝ පොදුවේ ගත්කල ද්‍රව්‍යය හෝ මනසින් වෙන් නො වෙයි. කාටීසිය තාප්පය බිඳවැටෙයි. මනසින් වෙන් වූ නිරපේක්ෂ ද්‍රව්‍යයක් ගැන කතාකළ හැක්කේ ක්වොන්ටම් භෞතික විද්‍යාව නොදත් අයට ය.

ක්වොන්ටම් භෞතිකය විසින් සිදුකරන ලද මේ වෙනස, එනම් කාටීසිය තාප්පය කඩාවැටීම පිළිබඳ කතාව අවුරුදු විස්සක් පමණ කාලයක මෙරට සාකච්ඡාවන නමුත් ඊනියා උගතුන් එයට නිසි අවධානය යොමු නොකිරීම කණගාටුදායක ය. මෙරට විශ්වවිද්‍යාලවල දර්ශන අධ්‍යයනාංශ ඇති නමුත් ඒ අංශවල මේ කරුණු නිසි ලෙස සාකච්ඡාවකට භාජනය නො වෙයි. පුවත්පත්වල ඊනියා පශ්චාත්නූතනවාදයකට හා පශ්චාත්නූතනවාදී සාහිත්‍යයකට වෙන්කරන ඉඩ කිසි දිනක කාටීසිය තාප්පය, කෝපන්හේගන් විවරණය, මනස හා ද්‍රව්‍යය අතර සම්බන්ධය ආදිය ගැන සාකච්ඡාකිරීමට නො ලැබෙයි. එහෙත් මේ පුවත්පත්කලාවේදීන් බොහෝ දෙනකු තමන් නොදන්නා හා නැති පශ්චාත්නූතනවාදයක් ගැන කතාකරන්නේ මහා දාර්ශනිකයන් මෙනි. ඔවුහු ශූන්‍යතාවාදය ගැන කතාකරති. එහෙත් ශූන්‍යතාවාදය බුදුදහමට එකග නොවන බව දැනගැනීමට ඔවුන්ට අවශ්‍යතාවක් නැත. මෙරට එකල වර්ධනය වූ ථෙරවාදයට වඩා නාගර්ජුනපාදයන්ගේ මාධ්‍යමිකවාදය උසස් යැයි මොවුහු සිතති. එහෙත් මොවුන්ට මේ කිසිවක් පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති බව නම් කිවයුතු ය. යුරෝපයෙන් බැරිනම් ඉන්දියාවෙන් ලැබෙන දැනුමක් මෙරට දැනුමට වඩා උසස් යැයි කියමින් ඊනියා කොදෙව්වක නොදියුණු බව ගැන කෑකෝ ගැසීම මොවුන්ට ඇති මහත් ම ශාස්ත්‍රීය කටයුත්ත ය. එහෙත් එවැන්නන් යුරෝපයේ වර්ධනය වූ කෝපන්හේගන් විවරණය ගැන සාකච්ඡා නොකරන්නේ ඇයි? තමන්ට එය පශ්චාත්නූතනවාදය මෙන් එහෙන් මෙහෙන් හෝ කියවාගැනීමට නොහැකිවීම එයට හේතුව ද? එසේත් නැත්නම් මෙරට සංස්කෘතියට හා චින්තනයට කෝපන්හේගන් විවරණය අවශෝෂණය කරගෙන වර්ධනයකිරීම නිසා ඒ ඔස්සේ සිංහල බෞද්ධ සංස්කෘතියට හා මෙරට ජාතික චින්තනයට වැදගත්කමක් ලැබෙනු දැකීමට ඇති අකමැත්ත එයට හේතුව ද?

මහාචාර්ය නලින් ද සිල්වා

© Prof. Nalin De Silva